මුදල් අමාත්‍යාංශය
நிதிஅமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம்,கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01 Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) -11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2020 – 12 - 17

**ප්‍රවෘත්ති නිවේදනය**

**රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින්, විශ්‍රාමිකයන්, සමෘද්ධිලාභීන් සහ ස්වයං රැකියාවල යෙදෙන්නන් සඳහා වන පරිපූරක උත්සව ණය පහසුකම් යෝජනා ක්‍රමය**

2020 වසරේදී කොවිඩ් 19 හි බලපෑම හේතුවෙන් අභියෝග ජය ගැනීමට දැඩි ලෙස කැපවී සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් තම ජීවන ක්‍රමය ගෙන යාමට කටයුතු කිරීම ඇගයීම වෙනුවෙන්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ උනන්දුවක් දක්වන සියලුම සේවකයින්ට මෙන්ම සමෘද්ධි ප්‍රතිලාභීන්, දෛනික රැකියාවල යෙදෙන්නන් හට පරිපූරක උත්සව ණය පහසුකමක් ලබාදෙන ලෙස අතිගරු ජනාධිපතිතුමා උපදෙස් ලබාදී ඇත.

මෙම ණය පහසුකම ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හරහා සියයට 0.625 ක මාසික පොළී අනුපාතයකට ලබා දෙන අතර, ණය ආපසු ගෙවීම 2021 ජනවාරි මාසයේ සිට ආරම්භව මාසික වාරික 10 කින් අය කිරීමට යටත් වේ. මෙම ණය පහසුකම පහත පරිදි සපයනු ලැබේ.

1. මසකට රු.50,000/- කට වැඩි වැටුප්/ආදායම් ලබන්නන් සඳහා රු. 50,000/- ක ණය මුදලක්
2. මසකට රු. 25,000/- ත් 50,000/- ත් අතර වැටුප්/ආදායම් ලබන්නන් සඳහා රු. 25,000/- ක ණය මුදලක්
3. මසකට රු. 25,000/- කට අඩු වැටුප් /ආදායම් ලබන්නන් සඳහා රු. 10,000 ක ණය මුදලක්

මේ අනුව, මෙම ණය පහසුකම් යෝජනා ක්‍රමය වහාම ක්‍රියාත්මක කිරීම සඳහා මහ භාණ්ඩාගාරය දැනටමත් ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

එම ණය පහසුකම ලබාගැනීමට කැමති රජයේ හෝ පෞද්ගලික සේවාවන්වල යෙදෙන සේවකයන්ට මෙම පරිපූරක සහන ණය ලබාගැනීමට පහසු කිරීම සඳහා එම ආයතනවල ප්‍රධානීන් සිය සේවකයන්ගේ සහතික කළ නාමලේඛණය තම සේවා ස්ථානය අසල පිහිටි අදාල

රාජ්‍ය බැංකු වෙත ඉදිරිපත් කළ විට, උත්සව සමයේ දී අවශ්‍ය කටයුතු සඳහා මෙම පහසුකම යොදා ගැනීමට හැකිවන සේ අදාල බැංකු විසින් එම ණය මුදල සේවකයන්ගේ ගිණුම්වලට බැර කරනු ලැබේ.

රජයේ විශ්‍රාමලාභීන් සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවත්, සමෘද්ධිලාභීන් සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසිනුත් මෙම පරිපූරක ණය පහසුකම ලබා ගැනීමට අවශ්‍ය ලිපිලේඛනමය පහසුකම් සපයනු ලැබේ. ඉහත සඳහන් රාජ්‍ය බැංකුවල තම ගිණුම් පවත්වාගෙන යනු ලබන ත්‍රීවිලර්, පාසල් වෑන් හා බස්රථ හිමියන්, පෞද්ගලික බස්රථ සේවකයන් වැනි අය සඳහා, තමන්ගේ බැංකු ගිණුම පවත්වාගෙන යනු ලබන රාජ්‍ය බැංකුව වෙත තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර මෙම සහන ණය මුදල සඳහා ඉල්ලුම් කළ හැකිය. මෙම ගනයට අයත් නොවන රාජ්‍ය බැංකුවල ගිණුම් පවත්වාගෙන යනු ලබන දෛනික රැකියාවල යෙදෙන්නන් සඳහා ද මෙම මූල්‍ය පහසුකම ලබාගැනීම සඳහා අදාළ රාජ්‍ය බැංකුවෙන් ණය ඉල්ලුම් කළ හැකි අතර, ණය ගෙවීමේ හැකියාව අනුව බැංකුව විසින් අදාළ ණය පහසුකම ලබාදෙනු ඇත.

මෙම පරිපූරක උළෙල ණය පහසුකම ලබා ගැනීම සඳහා සියලුම රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතනවල පූර්ණ සහයෝගය ඔවුන්ගේ සේවකයින්ට ලබා දීමටත්, මෙම පහසුකම ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත සඳහන් බැංකු සමඟ සම්බන්ධීකරණය කිරීමටත් කටයුතු කරනු ඇතැයි අතිගරු ජනාධිපතිතුමා අපේක්ෂා කරයි.

එම්.ජී. ජයතිස්ස,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ